# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2105/39 - 2019 ජනවාරි මස 10 වැනි බ්‍රහස්පතින්දා - 2019.01.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථානුකූලව මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2018 දෙසැම්බර් මස 28 වැනි දිනැති අංක 2103/33 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනය, 2019 ජනවාරි මස 09 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි පහත උපලේඛනයේ සඳහන් ලෙස සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2019 ජනවාරි මස 10 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

(1) එම නිවේදනයෙහි අධ්‍යාපන අමාත්‍ය (අංක 25) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 18 අයිතමය ඉවත් කිරීමෙන් ;

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 19 සහ 20 නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 12 සහ 13 අයිතමයන් ඉවත් කිරීමෙන් ;

(ඈ) එහි II වැනි තීරුවෙහි 14 අයිතමය නැවත අංකගත කිරීමෙන් ;

(ඉ) එහි III වැනි තීරුවෙහි දැක්වෙන පහත අයිතමයන් ඉවත් කිරීමෙන් ;

- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)

1A - G 28934 — 387 (2019/01)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(2) එම නිවේදනයෙහි නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය (අංක 08) ශීර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි :-

(අ) එහි I වැනි තීරුවෙහි දැක්වෙන 14 වෙනි අයිතමයට පසුව පහත අයිතමය ඇතුළත් කිරීමෙන් ;

15. බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

(ආ) එහි I වැනි තීරුවෙහි අයිතම 15 සහ 16 නැවත අංකගත කිරීමෙන් ;

(ඇ) එහි II වැනි තීරුවෙහි දැක්වෙන 7 වෙනි අයිතමයට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

"8. බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය
9. බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය"

(ඈ) එහි III වැනි තීරුවෙහි "මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව පනත (1981 අංක 66)" යන්නට පසුව පහත අයිතමයන් ඇතුළත් කිරීමෙන් ;

- බුද්ධශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාල පනත (1996 අංක 26)
- ශ්‍රී ලංකාවේ බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාල පනත (1981 අංක 74)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.